ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | : බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | : **2018.07.10** |

## <u>ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී.එල්.සී ආයතනයේ තැන්පත්කරුවන් සඳහා මුදල් ගෙවීම</u>

ඊ ටී අයි ෆිනෑන්ස් ලිමිටඩ් සහ ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී.එල්.සී යන ආයතන සම්බන්ධව 2018.01.02 දින නිකුත් කරන ලද පුවත්පත් නිවේදනය හා බැඳේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තැන්පත්කරුවන්ගේ ඉල්ලීම් සලකා බැලීමෙන් අනතුරුව ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී.එල්.සී ආයතනයේ මුළු තැන්පතු වගකීම් වලින් සියයට 10 ක් තැන්පත්කරුවන් වෙත ගෙවීමට, ආයතනය වෙත උපදෙස් ලබා දී ඇත. මෙම ගෙවීම 2018.07.10 දින ආරම්භ කෙරෙනු ඇත. මෙම ගෙවීම් සැලැස්ම පිළිබඳ විස්තර තැන්පත්කරුවන් වෙත ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී.එල්.සී ආයතනය විසින් ඉක්මනින් දැනුම් දෙනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබූ විධානයන් ක්‍රියාත්මක කිරීමට පසුගිය මාස 6ක කාලය තුළ සහයෝගය දැක්වූ සියලුම පාර්ශ්වයන්ට ශ්‍රී ලංකා මහ බැංකුව සිය ස්තූතිය පළ කර සිටින අතර, ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී.එල්.සී ආයතනයේ ව්‍යාපාරික කටයුතු

ප්‍රතිව්‍යුහගත කිරීමට හා එය ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරන ලද කළමනාකරණ මණ්ඩලයට සහයෝගය ලබාදෙන ලෙසත් එතෙක් ඉවසිලිවන්තව කටයුතු කරන ලෙසත් සියළුම තැන්පත්කරුවන්ගෙන් ඉල්ලා සිටී. මේ සම්බන්ධව ගනු ලබන තීරණ පිළිබඳ තොරතුරු යථා කාලයේදී දැනුම් දීමටද කටයුතු කරනු ඇත.